# බුදු දහමට පටහැණි ශූන්‍යතාව

ශූන්‍යතාව යනුවෙන් සංකල්පයක් ඇතිකිරීමෙන් නාගර්ජුනපාදයන් වහන්සේ බුදු දහම දුර්වල කළ බව මගේ මතය වෙයි. සසර සංකල්පයක් ලෙස ද සසරින් එතරවීම හෙවත් සංසාර ගමන නැවැත්වීම එහි විරුද්ධ සංකල්පය ලෙස ද ගත්විට ප්‍රශ්න ඇති නො වෙයි. සසරින් එතර වීම සංකල්පයක් ලෙස සාමාන්‍ය ජනතාවට තේරෙන පරිදි කිවහැකි ව තිබූ අතර නිවන සංකල්පයක් ලෙස නොගෙන නිවන් අවබෝධකිරීමේ හැකියාව ද තිබුණි. එහෙත් දැන් නාගර්ජුනපාදයන්ට අනුව නිවන සංකල්පයක් වී සසර යන සංකල්පයෙහි විරුද්ධය බවට පත්වෙයි. නිවන සංකල්පයක් වූ විට නිවන යන්න සසරින් එතරවීම යන පෘථග්ජන තේරුම ගනියි. එවිට සසරෙහි නිවන වේ , නිවනෙහි සසර වේ ආදී වශයෙන් ප්‍රකාශකිරීමේ හැකියාව ද නාගර්ජුනපාදයන්ට ලැබිණි. අප පැහැදිලිව තේරුම්ගත යුත්තක් නම් නිවන එලෙස සංකල්පයක් බවට පත්කිරීමෙන් නාගර්ජුනපාදයන් වහන්සේ ථෙරවාදී බුදුදහමින් වෙන් වූ බව ය.

නිවන සංකල්පයක් නොවී ම, හා ඒ පෘථග්ජන ව අවබෝධකිරීමට සසරින් එතරවීම වැනි සංකල්ප තිබීම නාගර්ජුනපාදයන් එකක් ලෙස ගෙන සංකල්පයක් නොවන්නක් සංකල්පයක් බවට පත්කිරීම මෙහි දී සිදු වූ වරද ය. නාගර්ජුනපාදයන්වහන්සේට අනුව නිවන යනු කාහටත් තේරෙන සසර ගමන නැවැත්වීම ය. එය තේරුම් ගත් පමණින් කිසිවකුටවත් නිවන් අවබෝධ නොවන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. නිවන එලෙස සංකල්පයක් බවට පත්කිරීමෙන් පසු නාගර්ජුනපාදයෝ ශූන්‍යත්වය දෙසූහ. එසේ කිරීමට උන්වහන්සේට සිදුවූයේ නිවන සංකල්පයක් බවට පත්කිරීම හේතුවෙන් ය.

මුළු ලෝකය ම සංකල්පීය ලෝකයක් බව නාගර්ජුනපාදයන් දකින්නට ඇත. ඒ සංකල්ප මිනිසාගේ නිර්මාන ලෙස ද උන්වහන්සේ දකින්නට ඇත. සංකල්පීය ලෝකයට පුටුව, පෑන ආදිය ද, අවකාශය හා අවකාශ-කාලය වැනි දී ද, ගුඪ අගාධ (බලඅවක හඔලඑස) ද මන්දාකිණද සෞරයග්‍රහ මණ්ඩලය ද කුලකය වැනද ගණිත සංකල්ප ද අයත් වෙයි. මේ සංකල්පීය ලෝකය සාපේක්‍ෂ ය. එය මිනිසුන්ගේ නිර්මාන වෙයි. ඒ ඒ පුද්ගලයාට තම තමන්ගේ සංකල්පීය ලෝක වෙයි. මගේ ලෝකය යනු මගේ සංකල්පීය ලෝකය යි. මිනිසුන් හැරෙන්නට වෙනත් සතුන්ට ද තම තමන්ගේ සංකල්පීය ලෝක වෙයි.  ඒ ඒ සංකල්පීය ලෝක අනෙක් සංකල්පීය ලෝකවලින් වෙනස්වෙයි.

මුළු ලෝකය ම සංකල්පීය ලෝකයක් නම් සංකල්ප යනු අපේ නිර්මාන නම් ඉන් කියැවෙන්නේ අප ලෝකය යැයි ගන්නා දෙය ශූන්‍යයක් බව ය. අප අතන පුටුව යැයි කීව ද එතැන පුටුවක් නැත. ඇත්තේ, එසේත් නැත්නම් අප ඇතැයි යනුවෙන් ගන්නේ පුටුව පිළිබඳ සංකල්පයක් පමණකි. එසේ නම් ලෝකය ශූන්‍ය වෙයි. ලෝකය ශූන්‍ය යැයි කීමේ වරදක් නැත. සංකල්පවල ඇති ඊනියා යථාර්ථයක් වාස්තවිකත්වයක් නො වෙයි. එසේ නම් අපේ සංකල්ප, එනම් පුටුව යනාදිය ශූන්‍ය වෙයි.

එහෙත් ප්‍රශ්නය වනුයේ ඒ ශූන්‍ය වූ සංකල්ප ශූන්‍යතාවක් බවට පත්කිරීම ය. සංකල්පීය වශයෙන් ගත්කල එහි ඇති ශූන්‍ය බව සංකල්ප සම්බන්ධයෙන් වෙයි. එහෙත් ඒ ශූන්‍ය බව නාම පදයකින් හඳුන්වන ශූන්‍යතාවක් බවට පත්කරන්නේ කෙසේ ද? සංකල්පවලින් හැඳින්වෙන දෙයක් නැති බව, එනම් මනසට විසින් තනාගත් සංකල්පවලින් හැඳින්වෙන දෙයක් වාස්තවික ව නැති බව කීම එකකි. එහෙත් එහි ඇත්තේ ශූන්‍යතාවක් බව කීම තවත් එකකි. සංකල්පයක් වූ සසර ගමන නැවැත්වීම හෙවත් සසරින් එතරවීම, සංකල්පයක් නොවූ නිවන සමග එකට ගැනීමත් සමග මේ වරද සිදුවන බව පැහැදිලි වෙයි.

නාගර්ජුනපාදයන් වහන්සේට නිවන සංකල්පයක් බැවින් හා සංකල්පවලින් දැක්වෙන ලෝකය ශූන්‍ය බැවින් නිවන ද ශූන්‍ය විය යුතු ය. දැන් සසරින් එතරවීම සඳහා කෙනකු අවබෝධ කළ යුත්තේ මේ සියල්ලෙන් ම කියැවෙන ශූන්‍යතාව ය. ශූන්‍යතාවට ගඳක් සුවඳක් පාටක් හෝ වෙනත් ගුණයක් නැත. ඒ මනසින් අවබෝධ කළ හැකි වූවක් නො වෙයි. එසේ නම් ශූන්‍යතාව යනු කුමක් ද? ඒ සංකල්පයක් ද? නැත් ද? සංකල්පයක් මෙන් ම සංකල්පයක් නොවන්නක් ද? එසේත් නැත්නම් සංකල්පයක් නොවන්නේ හා සංකල්පයක් නොවන්නක් නොවන්නේ ද?

© Prof. Nalin De Silva

නාගර්ජුනපාදයන් වහන්සේ ශූන්‍යතාවෙහි විරුද්ධය කුමක් දැයි නො කියති. එසේ නම් අඳුර - එළිය, සසර - නිවන විරුද්ධයන් ක්‍රමයට ශූන්‍යතාව අවබෝධකිරීමට නො හැකි ය. ශූන්‍යතාවට සාපේක්ෂ වූවක් නැති බව නාගර්ජුනපාදයන් වහන්සේ ගොඩනගා ඇති පද්ධතියෙන් අපට පෙනී යන කරුණ වෙයි. ශූන්‍යතාව අවබෝධකරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය උන්වහන්සේගේ සාකච්ඡාවට බඳුන් නො වෙයි. නිවන, නිවන ලෙස පමණක් නො ගෙන නිවන සංකල්පයක් ලෙස ගැනීමෙන් උන්වහන්සේ මහත් අමාරුවකට පත් වී ඇති බව පැහැදිලි ය. උන්වහන්සේ එවැනි තැනකට යොමු වූයේ සාමාන්‍ය පෘථග්ජනයන් අතර, නිවන, සංසාරයෙන් එතරවීම ලෙස ප්‍රචලිත වී තිබුණු බැවින් ද?

නාගර්ජුනපාදයන් වහන්සේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ගැන එලෙසින් ම කටයුතු කෙළේ දැයි නිසැක ව කිව නොහැකි ය. ඇතැම් විට උන්වහන්සේ අනිත්‍ය නිත්‍ය යන්නෙහි විරුද්ධය ලෙස ද අනාත්ම ආත්ම යන්නෙහි විරුද්ධය ලෙස ද සලකන්නට ඇත. සමහරවිට ශූන්‍යතාව ඒ සියල්ලට ඔබ්බෙන් වූවක් විය හැකි ය. ඒ කෙසේ වෙතත් පැහැදිලි කරුණ නම් ශූන්‍යතාවට විරුද්ධයක් නැති බව ය.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ නාගර්ජුන හිමියන්ගෙන් සියවස් කිහිපයක් යෑමට පෙර බුදු දහමට වෛදිකයන්ගෙන් පහර වැදීම ය. නාගර්ජුන හිමියන්ට අවශ්‍ය වූයේ නිවනට ප්‍රවාදයක් නිර්මානය කිරීම විය හැකි ය. උන්වහන්සේ උත්පත්තිය ලැබුයේ බ්‍රාහ්මණ පවුලක ය. අප කලින් ද කියා ඇති පරිදි වෛදික සංස්කෘතියෙහි බ්‍රාහ්මණයෝ බටහිරයන් පමණට ම නැති වුවත් වියුක්ත ප්‍රවාද ගොඩනැගීමෙහි රුසියෝ වූහ. බුදු දහම වැළඳගත් බ්‍රාහ්මණ පවුල්වල ඇතැම් අයට වෛදික වියුක්ත ප්‍රවාද තැනීමේ සම්ප්‍රදායෙන් බැහැරවීමට නො හැකි විය. බ්‍රාහ්මණ පවුල්පල උපතලත් ථෙරවාදී භික්ෂූන් වහන්සේ ද භාරතයේ දී වියුක්ත ප්‍රවාද ගොඩනැගූහ. නාගර්ජුනපාදයන් වහන්සේට පෙර ද භාරතයේ ඇතැම් ථෙරවාදී භික්ෂූන් වහන්සේ ද වියුක්ත ප්‍රවාද ගොඩනගා ඇත.

ථෙරවාදයෙහි වියුක්ත ප්‍රවාද ගොඩනැගීම නතර වූයේ ලංකාවේ දී යැයි සිතිය හැකි ය. එය ලංකාව ඇතුළු ප්‍රාග් වෛදික සංස්කෘතීන් හි ලක්ෂණයක් යැයි පෙනී යයි. බුදු දහම ද ප්‍රාග් වෛදික සංස්කෘතියක උපත ලද හෙයින් මුල් බුදු සමයට සමීප වූ ථෙරවාදයක් ලංකාවෙහි මුල් ඇල්ලීම පුදුමයක් නො වෙයි. එමෙන් ම මෙරට කිසි දිනෙක භාරතයේ මෙන් බ්‍රාහ්මණ ආධිපත්‍යයක් ද නො වීය.

නාගර්ජුනපාදයන් වහන්සේ භාරතයේ බිහිවූ විශිෂ්ටතම බුද්ධිමතා විය හැකි ය. එහෙත් උන්වහන්සේ ථෙරවාදියකු වී යැයි කියන මතය නො පිළිගතහැකි වෙයි. සසරට සාපේක්ෂව නිවන ගත්තැන ම උන්වහන්සේ ථෙරවාදයෙන් ඉවත්වන සේක. ඉන්පසු එහි වර්ධනයක් හෝ එහි පරිපූරයක් ලෙස ශූන්‍යතා සංකල්පය නිර්මානයකිරීමෙන් උන්වහන්සේ නිවනට වඩා ගැඹුරු දහමක් විමුක්තිය සඳහා නිර්මානය කළහ. මුල් බුදු සමයෙහි ශූන්‍ය ද වේ යනුවෙන් තර්කකරන ඇතැම් උගතුන්ගෙන් ප්‍රශ්නකිරීමට ඇත්තේ මුල් බුදුසමයෙහි ශූන්‍යතාව ද වේ ද යන්න ය. ශූන්‍ය හා ශූන්‍යතාව එකට පටළවා නො ගතයුතු ය.

නාගර්ජුනපාදයන් වහන්සේගේ ශූන්‍යතාව පසු කලෙක වෛදිකයකු වූ ශන්කරාචාර්යවරයන්ගේ විවේචනයට භාජනය විය. එතුමෝ ද භාරතයේ පහළ වූ අති විශිෂ්ට බුද්ධිමතෙක් වූහ. හින්දු ආගම ආගමක් ලෙස නිර්මානය කෙළේ හයවැනි සියවසේ ජීවත් වූ ශන්කරාචාර්යවරයාණන් වහන්සේ ය. එහෙත් ඒ ආගමට හින්දු යන නම තැබුයේ එතුමා නො වෙයි. එය පසුකාලීන මුස්ලිම්වරුන්ගේ කාර්යයක් විය. සින්ධු ගංගාවෙන් නැගෙනහිරට සංස්කෘතිය හා ජනතාව මුස්ලිමුන් විසින් හඳුන්වනු ලැබුයේ සින්ධු හෙවත් හින්දු යන නමින් ය. පසුව යුරෝපීයයෝ මේ ව්‍යවහාරය තවත් ප්‍රචලිත කළහ. නම කවුරුන් තැබුව ද කවුරුන් ප්‍රචලිත කළ ද හින්දු ආගම නිර්මානයකිරමේ මූලික කර්තව්‍යය කළෝ ශන්කරාචාර්යයෝ ය.

හින්දු ආගම යනු වෛදික ආගමෙහි ද, බුදු දහමෙහි ද, ජෛන ආගමෙහි ද සංකලනයක් වෙයි. අවාසනාවකට භාරතයේ ද ලංකාවේ ද බොහෝ දෙනා මේ බව නො දනිති. එයට හේතුව හින්දූන් වෙනත් මතයක් ඉතා සාර්ථකව ප්‍රචාරයකර තිබීම ය. ඔවුන් ප්‍රචාරයකර ඇති මතයට අනුව හින්දු ආගම සිදුහත් කුමරු ඉපදීමට පෙර ද භාරතයේ තිබුණි. මෑත කාලයේ ඉන්දියාවේ උපන් උසස් පඬිවරයකු ලෙස සැලකෙන සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් මහතා පවා කියා ඇත්තේ බුදුන් වහන්සේ හින්දුවරයකු ලෙස ඉපදී හින්දුවරයකු ලෙස ජීවත් වී හින්දුවරයකු ලෙස මියගිය බව ය.

© Prof. Nalin De Silva

එහෙත් එතුමන් වැනි අය අමතක කරුණ නම් ශුද්ධෝදන රජතුමා හින්දුවරයකු නොවූ බව ය. ශුද්ධෝදන රජතුමා වැඩිම වුවහොත් අර්ධ වෛදික රජකු ලෙස මුල් කාලය ගතකරන්නට ඇත.

හින්දු උගතුන්ට අනුව වෛදික ආගම යනු හින්දු ආගම ය. ඔවුන් සිදුහත් කුමරු හින්දුවරයකු යැයි කියන්නේ එතුමන් වෛදිකයකු ලෙස ගනිමින් ය. එහෙත් ඔවුන්ට පිළිතුරු නැති ප්‍රශ්නයක් වෙයි. වෛදික ආගම හා හින්දු ආගම අතර විශාල පරස්පරයක් ඇත්තේ කෙසේ ද යනු ඒ ප්‍රශ්නය වෙයි. වෛදික ආගම බළි බිලි පූජා ඔස්සේ විමුක්තිය බලාපොරොත්තු වෙයි. එහි වෙනත් බටහිර ආසියාතික ආගම්වල මෙන් ම හිංසාව රජයයි. යුදෙව් ආගමේ ද පසුකාලීන ව ඇතිවුණු ක්‍රිස්තියානි ආගමේ හා ඉස්ලාම් ආගමේ ද සතුන් මැරීම ප්‍රශ්නයක් නො වෙයි. ඇතැම් ආගම්වල දෙවියන් වහන්සේ සතුටුකිරීම සඳහා සතුන් බිලිදීම කෙරෙයි. ආර්යයන් බටහිර සිට භාරතයට පැමිණෙන විට මේ ආකල්ප බටහිර ආසියාවෙන් භාරතයට ගෙනෙන්නට ඇත. ඔවුහු භාරතයේ වෛදක සංස්කෘතිය ගොඩනැගීමේ දී ඒ බටහිර ආසියාතික මූල සහිත සංස්කෘතිකාංග ද මිශ්‍ර කළහ. වෛදිකයෝ දෙවියන් වෙනුවෙන් යාග හෝම කළහ. භාරතයේ විසූ ප්‍රාග් වෛදිකයේ යාග නොව යෝග පුහුණු කළහ.

දෙවියන්, එනම් බ්‍රහ්මන් සතුටුකිරීමට සතුන් බිලිදුන්, සෝම පානය කළ වෛදිකයන් අවිහිංසාව අගයන හින්දූන් බවට පත්වූයේ කෙසේ ද? මෙය ඉතිහාසයේ සංස්කෘතීන් මිශ්‍රවීමේ දී සිදුවන ඇතැම් කරුණු විදහා දක්වන සුවිශේෂ සිද්ධියකි. භාරතයට ආර්ය සංස්කෘතියක් ගෙනැවිත් වෛදික සංස්කෘතියක් ඇතිකළවුන් ඇතැම් කරුණුවලින් ප්‍රාග් භාරතීය සංස්කෘතියට කල්යෑමේ දී පරාජය වූ ආකාරය  මෙයින් පැහැදිලි වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva